# 18 බුදුසසුන පතළ කළ තෙවන සංගීතිය

ශාසන ඉතිහාසයෙහි සංගායනාවලට හිමිවන්නේ සුවිශේෂ ස්ථානයකි. සම්බුදු සසුන ආරක්ෂා කර ගැනීමේ දී එ මගින් ඉටු වී ඇත්තේ අමිල මෙහෙයකි. බුදුසසුනෙහි සංගායනා පැවැත්වීමේ අවශ්‍යතාවක් මතුවුණේ කිසියම් ශාසනික අර්බුදයක් ඇති වූ විට ය. පළමු, දෙවන සහ තෙවන සංගායනා පැවැත්වීමට හේතු වූ කරුණු දෙස බැලීමේ දී ඒ බව පැහැදිලි වේ.

දෙවන සංගීතියෙන් පසු වසර එකසිය තිස් හයක් වූ කාලය තුළ බුදු සසුනේ ඇති වූ නොයෙක් විපරීත තත්ත්වයන් තෘතීය සංගීතියට හේතු වූ බව පෙනේ. දෙවන සංගීතියට දයකත්වය දුන් කාලාශෝක රජතුමාගෙන් පසුව රාජ්‍ය බලය නන්ද පරපුරට හිමි විය. එහි අවසාන පාලකයා වූයේ ධනනන්ද ය. චානක්‍ය නම් බමුණෙක් ඔහු මරා චන්‍ද්‍රගුප්ත මෞර්ය රජුට බලය පවරා දුන්නේ ය. ඔහුගෙන් පසු රාජ්‍යය හිමි වූයේ බින්දුසාර රජුට ය. කාලයාගේ ඇවෑමෙන් මෞර්ය පෙළපතේ ශ්‍රේෂ්ඨතම රජු වූ අශෝක රජුට රාජ්‍යය හිමි විය.

මොහු උපත ලබන්නේ ජෛන භක්තික පවුලක ය. ඇතැම් තැනක ආජීවක බැතිමතකු ලෙස ද සඳහන් වේ. එහෙත් අශෝක රජු බුදු දහම වැළඳ ගන්නා අවධිය වන විට තම පූජකයන් වූ නිගණ්ඨ ශ්‍රාවකයන් ගැනත්, සෙසු ආජීවක පරිබ්‍රාජකයන් ගැනත් එතරම් ප්‍රසාදයකින් නොසිටි බව වංශකථා තොරතුරුවලින් හෙළි වේ.

අශෝක රජුගේ සිත බුදු දහම කෙරෙහි ඇදී යාමට ප්‍රබල හේතුවකි, ඔහු විසින් කරන ලද කාලිංග යුද්ධය. තම අභිෂේකයෙන් අටවන අවුරුද්දේ රජු කාලිංගය ආක්‍රමණය කරයි. මේ සටනේ දී භටයෝ ලක්ෂයක් මරණයට පත් වූහ. එක්ලක්ෂ පනස්දහසක් සිර භාරයට ගෙන රටින් පිටුවහල් කරන ලදි. මියගිය සෙසු අයගේ ගණන ඉතා විශාල ය. යුද්ධයේ දී සිදු වූ මේ දරුණු මිනිස් සංහාරය ගැන අශෝක රජතුමා ඉතාමත් කනගාටු වන බව ඔහුගේ 13වන ගිර්නාර් ශිලා ලිපියෙහි ප්‍රකාශ වෙයි. කලිඟු ජයග්‍රහණය සිදු වූ ද පටන් රජුගේ ධර්ම චර්යාවත්, ධර්ම ආශාවත් අතිශයින් ම දැඩි විය. කඩුවේ බලයෙන් දිග්විජය කරනු වෙනුවට ධර්මයේ බලයෙන් ධර්මවිජය කිරීම වෙත රජුගේ සිත යොමු විය. ධර්මවිජයෙන් මෛත්‍රිය පැතිරවිය හැකි ය යන්න එතුමාගේ දැඩි විශ්වාසය විය.

මෙම පසුබිම මත අශෝක රජතුමා බුදු දහම වැළඳ ගත්තේ ය. ඔහු බෞද්ධයකු වූ අන්දම පිළිබඳ විවිධ අදහස් දක්නට ලැබෙයි.

බොහෝ මූලාශ්‍ර සඳහන් කරන්නේ තීර්ථකයන්ගේ නො හික්මුණු ඉරියව් ගැන කලකිරී, කාලිංග යුද්ධයෙන් අසහනයට පත් ව සිටි රජු දැමුණු ඉඳුරන් ඇති ව මහමග

වඩිමින් සිටි න්‍යග්‍රෝධ සාමණේරයන් වහන්සේ දැක පැහැදී උන් වහන්සේ රජ මැදුරට වැඩමවා "අප්පමාදෝ අමත පදං" යන ගාථාවෙන් දහම් අසා බුදු දහම වැළඳ ගත් බවයි.

## තුන්වන සංගායනාවට බලපෑ හේතු

බුදු දහම වැළඳ ගත් අශෝක රජු විසින් භික්ෂූන් වහන්සේටත්, බුද්ධ ශාසනයටත් දක්වන ලද්දේ මහත් අනුග්‍රහයකි. පිළිවෙළින් දිනපතා භික්ෂු ප්‍රමාණය දෙගුණ කරමින් සැට දහසක් භික්ෂූන් වහන්සේට දානය පූජා කළ රජු බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද ධර්මස්කන්ධ එක එකක් අරමුණු කොට ගෙන අසූහාර දහසක් වෙහෙර විහාර ඉදි කෙළේ ය.

ධර්මාශෝක රජු බුදු දහමට අසීමිත ව අනුග්‍රහ දැක්වීමත් සමග ම තීර්ථකාදී අන්‍ය ලබ්ධිකයන්ගේ තත්ත්වය පිරිහෙන්නට වූයේ ය. ඔව්හු බුදු දහමට පටහැනිව විවිධ ව්‍යාපාර ආරම්භ කළහ. රාජකීය ලාභ සත්කාරයට ගිජු වූ ඇතැම් තීර්ථකයෝ ජීවිකාව සඳහා සසුන්ගත වූහ. ඔවුන්ගේ ගතිපැවතුම් සිරිත් විරිත් ථේරවාදී බුද්ධ පුත්‍රයන්ට පටහැනි විය. ඔවුන්ගේ නො මනා හැසිරීම් නිසා බුදු සසුන කිලිටි වී ගියේ ය; අවුල් විය. ඔවුහු ධර්මය අධර්මය කරමින් මහත් ශාසන අර්බුදයක් ඇති කළහ. මේ තත්ත්වය යටතේ සිල්වත් භික්ෂූන් වහන්සේලාට එක් ව විනය කර්ම ආදිය කළ නො හැකි තත්ත්වයක් උදා විය. දඹදිව සියලු ආරාමයන්හි භික්ෂූන් වහන්සේලා අවුරුදු 7ක් ම පොහෝ දිනවල කෙරෙන විනය කර්ම නො කළහ. මොග්ගලීපුත්තතිස්ස මහ රහතන් වහන්සේ 'අහෝ ගංගා තීරයට' වැඩ තනි ව වාසය කළහ.

සත් අවුරුද්දක් පොහොය කිරීම සිදු නොවූ බව දැන ගත් රජතුමා ඇමැතියකු මගින් භික්ෂූන් වහන්සේලාට පොහොය කරන ලෙස දන්වා පණිවිඩ යැවී ය. අශෝකාරාමයට ගිය ඇමැති භික්ෂූන්වහන්සේලාට පොහොය කරන ලෙසට අණ කරයි. එහෙත් පිරිසේ පිරිසිදු බවක් නැති නිසා පොහොය කර්ම කළ නො හැකි බව භික්ෂූන් වහන්සේලා ඇමැතිට දන්වති. රජ අණ කඩ කළ භික්ෂූන් වහන්සේ කිහිප නමක් ඇමැති අතින් ඝාතනයට ලක් වෙති. රජුගේ සහෝදරයකු වූ තිස්ස නම් තෙරුණුවන්ගේ මැදිහත් වීමෙන් භික්ෂු ඝාතනය නිම වේ. මේ පුවත දැනගත් රජු බලවත් සංවේගයට පත් වේ. මොග්ගලීපුත්තතිස්ස මහ රහතන් වහන්සේ මුණගැසී සාකච්ඡා කර තම නිවැරැදිභාවය අවබෝධ කර ගත් රජු ශාසන සංශෝධනයක් කිරීමට ඉටා ගනී. හෙතෙම මොග්ගලීපුත්තතිස්ස මහරහතන් වහන්සේගේ උපදෙස් පරිදි දුසිල් මහණුන් සුදුවත් හඳවා සසුනෙන් නෙරපා හැරියේ ය. සසුනෙන් බැහැර කළවුන් සැට දහසක් බව සඳහන් වේ. ඔවුන් බැහැර කිරීමෙන් පසු භික්ෂූන් වහන්සේලා විනය කර්මවල යෙදුණාහ. රජතුමා මොග්ගලීපුත්තතිස්ස මහරහතන් වහන්සේගේ පූර්ණ උපදෙස් මත තුන්වන සංගායනාවට අවශ්‍ය කටයුතු සූදානම් කෙළේ ඉනික්බිති ව ය.

## මූලික තොරතුරු

| | | |
|---|---|---|
| ⌖ | කාලය | බුද්ධ පරිනිර්වාණයෙන් වසර 236කට පසු |
| ⌖ | ස්ථානය | පැළලුප් නුවර අශෝකාරාමය |
| ⌖ | ප්‍රධානත්වය | මොග්ගලීපුත්තතිස්ස මහරහතන් වහන්සේ |
| ⌖ | ප්‍රධාන දායකත්වය | ධර්මාශෝක මහ රජතුමා |
| ⌖ | සහභාගිත්වය | රහතන් වහන්සේලා 1000 |
| ⌖ | අතිරේක නාමය | සාහස්සිකා |
| ⌖ | ගත වූ කාලය | මාස 9යි. |

## ප්‍රතිඵල


තුන්වන ධර්ම සංගායනාවෙන් උද වූ වැදගත් ප්‍රතිඵල කිහිපයක් දැක ගත හැකි ය. මොග්ගලීපුත්තතිස්ස මහරහතන් වහන්සේ පරවාදී මත හෙවත් අන්‍ය නිකායික මත 500 ඛණ්ඩනය කරමින් සකවාද හෙවත් ථේරවාද මත තහවුරු කරමින් කථාවත්ථුප්පකරණය නම් අභිධර්ම ග්‍රන්ථය රචනා කළහ. මේ නිසා භික්ෂූන් වහන්සේලා අතර පැවති විවිධ දුර්මත බැහැර විය. එය අභිධර්ම පිටකයට එක් වීමෙන් ථේරවාදී ත්‍රිපිටකය සම්පූර්ණ විය.

තෙවන ධර්ම සංගායනාවේ වැදගත් ම ප්‍රතිඵලය නම් බුදු සමය භාරතය තුළත් ඉන් පිටස්තර දේශවලත් ව්‍යාප්ත කිරීම සඳහා ධර්මදූත සේවාවක් සිදු කිරීමයි. එය ධර්මාශෝක රජතුමාගේ අනුග්‍රහයෙන් සිදු වූ විශිෂ්ට ඓතිහාසික සේවාවකි. මෙහි අනුශාසකත්වය දැරුවේ මොග්ගලීපුත්තතිස්ස මහරහතන් වහන්සේ ය. එහි දී ප්‍රදේශ නවයකට ධර්මදූතයන් වහන්සේ යවනු ලැබූහ. ධර්මවිනයධර ප්‍රධාන තෙර නමකගේ නායකත්වය යටතේ ධර්මදූත කණ්ඩායම් සැකසී තිබිණි. එක් කණ්ඩායමකට උපසම්පන්න භික්ෂූන් වහන්සේ පස් නමක් ඇතුළත් කරවූයේ උපසම්පද ආදී විනය කර්ම සිදු කිරීමේ පහසුව සඳහා ය.

තෙවැනි ධර්ම සංගීතියේ ප්‍රතිඵලයක් වශයෙන් බුදු දහම ව්‍යාප්ත වූ රටවල් ද, ඒ ඒ රටවලට වැඩම කළ තෙරවරුන් ද, කරන ලද දේශනාවන් ද, පහත දැක්වෙන අයුරින් පෙන්වා දිය හැකි ය.

| රට | ප්‍රධානත්වය | කරන ලද දේශනාව |
|---|---|---|
| කාශ්මීර ගන්ධාර | මජ්ඣන්තික තෙරණුවෝ | ආසිවිසෝපම සූත්‍රය |
| මහිස මණ්ඩල | මහාදේව තෙරණුවෝ | දේවදූත සූත්‍රය |
| වනවාස දේශය | රක්ඛිත තෙරණුවෝ | අනමතග්ග සංයුත්තය |
| අපරන්ත දේශය | යෝනක ධම්මරක්ඛිත තෙරණුවෝ | අග්ගික්ඛන්ධෝපම සූත්‍රය |
| මහාරට්ඨ | මහාධම්මරක්ඛිත තෙරණුවෝ | මහානාරද කස්සප ජාතකය |
| යෝනක දේශය | මහාරක්ඛිත තෙරණුවෝ | කාලකාරාම සූත්‍රය |
| සුවණ්ණ භූමි | සෝණ උත්තර තෙරවරුන් | බ්‍රහ්මජාල සූත්‍රය |
| හිමවත් පෙදෙස | මජ්ඣිම තෙරණුවෝ | ධම්මචක්කප්පවත්තන සූත්‍රය |
| තම්බපණ්ණි (ශ්‍රී ලංකාව) | මහාමහින්ද තෙරණුවෝ | චූළහත්ථිපදෝපම සූත්‍රය |

මෙම ධර්මප්‍රචාරක සේවාවන් ගැන වංශකථාවල දීර්ඝ විස්තර සඳහන් වේ. මොග්ගලීපුත්තතිස්ස මහරහතන් වහන්සේගේ නායකත්වය මෙහි සාර්ථකත්වයට බෙහෙවින් හේතු විය. අශෝක මහරජුගේ පුත් මහින්ද මහරහතන් වහන්සේත්, දියණිය සංඝමිත්තා මහරහත් තෙරණින් වහන්සේත්, ශ්‍රී ලංකාවට වැඩම කරවීමෙන් රජු අප රට කෙරෙහි දැක්වූ විශේෂත්වය පෙන්නුම් කරයි. ලෝකයේ ථේරවාදී බුදු දහම සුරක්ෂිත ව පවත්නා ප්‍රධාන රට ශ්‍රී ලංකාවයි. අපේ මේ පුංචි රටට එම ගෞරවය හිමි වූයේ තුන් වන ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයක් වශයෙන් නිර්මල බුදු දහම අපට ලැබුණු බැවිනි. එම දහම රැක ගැනීමේ උතුම් වගකීමෙන් කොටසක් අප හැම දෙනාට ම පැවරී ඇත. එම වගකීම අප ඉටු කළ යුතු ය.




සසුන පිහිට වූ දේශයන් නවය

## සාරාංශය

සම්බුද්ධ පරිනිර්වාණයෙන් වසර 236 ගතවන විට මෞර්ය අධිරාජ්‍යයේ අශෝක කුමරා රජ වේ. ඔහුගෙන් බුදුසසුනට සිදු වූ අසීමිත සේවා සහ ලාභ සත්කාර නිසා මිසදිටුවෝ සසුන් ගතවී නිර්මල ථේරවාදී සසුන කිලිටි කරති. මේ නිසා මොග්ගලීපුත්තතිස්ස මහරහතන් වහන්සේ තෙවන සංගායනාවට පසුබිම සකස් කළහ. පැළලුප් නුවර අශෝකාරාමයේ දී භික්ෂූන් වහන්සේලා දහසකගේ සහභාගිත්වයෙන් මොග්ගලීපුත්තතිස්ස මහරහතන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් සංගායනාව පැවැත්විණි. නව මසකින් නිමාව දුටු මෙහි දායකත්වය දරන ලද්දේ ධර්මාශෝක රජු විසිනි. මිසදිටුවන් සසුනින් බැහැර කිරීම, කථාවත්ථුප්පකරණය රචනා වී ත්‍රිපිටකය සම්පූර්ණ වීම, නව රට සසුන් පිහිටුවීම නිසා විදේශයන්හි බුදු දහම පැතිරයාම සංගායනාවේ ප්‍රතිඵල වේ. සුවිශේෂ ම ප්‍රතිඵලය නම් ශ්‍රී ලංකාවට බුදු දහම ලැබීමයි.

## ක්‍රියාකාරකම්

01. තුන්වන ධර්ම සංගායනාව පැවැත්වීමට බල පෑ හේතු කෙටියෙන් දක්වන්න.

02. බුදු දහමේ ව්‍යාප්තියට තුන්වන සංගායනාව පදනම් වූ අයුරු පැහැදිලි කරන්න.

## පැවරුම

මෙම පාඩමේ දැක්වෙන සිතියම මූර්තියක් ලෙස මැටියෙන් පිළියෙල කරන්න.